# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1771/18 - 2012 අගෝස්තු මස 15 වැනි බදාදා - 2012.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3 (2) වන උපවගන්තිය යටතේ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධිත) පනතේ 3(2) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මම ආයෝජන හා සංචාරක විෂයභාර අමාත්‍යවරයා ලෙස මෙම නිවේදනය මගින් -

(1) ඇමෙරිකානු ඩොලර් එකසිය පනස් අට මිලියන අට ලක්ෂ අනූ දහසක (ඇ.ඩො. 158,890,000) ක මුලු ආයෝජනයකින් යුත් කාමර 475කින් අනුයුක්ත නාගරික හෝටලයක් ඇතුලුව සේවා බද්ධ නිවාස 90 ක් බස්නාහිර පළාතේ කොළඹ 03, ගාලු පාර, අංක 116 දරන ස්ථානයෙහි ඉදිකර ක්‍රියාත්මක කිරීමේ මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලබන බවත්, මෙම ව්‍යාපෘතිය රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමිකර දෙන අතර රටේ භූ දර්ශනය වෙනස් කිරීමට ද තුඩුදිය හැකි බවත් දන්වා සිටින අතර, සීමාසහිත සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම ("ව්‍යාපෘති සමාගම") සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ව්‍යාපෘති ගිවිසුමකට වර්ෂ 2012 ක්වූ ජූලි මස 19 වැනි දින එළඹෙන ලද බවත් නිවේදනය කරමි.

(2) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග සීමාසහිත සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම, ව්‍යාපෘති ගිවිසුමට එළඹුණු දිනය වන, වර්ෂ 2012 ක් වූ ජූලි මස 19 වැනි දින සිට ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර, එකී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු ඉහත කී ව්‍යාපෘති ගිවිසුමට එළඹුණු දින සිට මාස විසි හතර (24) ක කාලයක් තුළ ඇරඹිය යුතු බවත් ප්‍රකාශ කරමි ;

(3) ඉහත කී ව්‍යාපෘතියෙහි කාර්යය සඳහා සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව මෙහි උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම සමාගමට අදාළ වන බවට ද නිශ්චිතව දක්වනු ලබමි.

#### උපලේඛනය

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

(i) වසර දහය (10) ක කාලසීමාවක් සඳහා ව්‍යාපෘති සමාගමේ බදු ගෙවිය යුතු ලාභය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලින් නිදහස් වේ. (බදු නිදහස් කාලය). එකී වසර දහය (10) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01) ක කාල පරිච්ඡේදයක් සඳහා ලාභවලින් කොටස් කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා බදු නිදහස ලැබේ.

(ii) එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර තුන (03) කට පසු යන දෙකින් කලින් එළඹෙන දින සිට ආරම්භ වේ.

(iii) ඉන්මතු ඉහත සඳහන් බදු නිදහස් කාල පරිච්ඡේදයේ අවසාන දිනයට අනතුරුව එළඹෙන ඉක්බිති වසර පහළොව (15) ක කාල පරිච්ඡේදයක් (සහනකාරී බදු කාලය) සඳහා ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායම සියයට හය (6%) ක් හෝ හෝටල් කර්මාන්තයට අදාල පවත්නා බදු අනුපාතයෙන් අඩක් 1/2 වන දෙකින් කවර හෝ අවම අනුපාතයකට බදු අය කරනු ලැබේ.

(iv) ඉහත විදහා පෙන්වා දී තිබෙන බදු නිදහස් කාල සීමාව සහ සහනකාරී බදු කාල සීමාව ඉකුත්වීමෙන් පසුව දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව එවිට බල පවත්වන සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘති සමාගම කෙරෙහි අදාල වනු ඇත.

(v) සේවකයින් 20 දෙනෙකුගේ උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාසික සේවකයන් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු නිදහස ව්‍යාපෘතිය වාණිජමය කටයුතු ඇරඹීමේ දින සිට වසර පහ (5) ක කාලයක් සඳහා වලංගු වනු ඇත. ව්‍යාපෘති සමාගම ප්‍රවාසික සේවකයන් දේශීය සේවකයන් මගින් ක්‍රමාත්මකව ප්‍රතිස්ථාපනය කිරීමට උපරිම උත්සාහ ගත යුතුය.

(vi) පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වේ.

(අ) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය මත පොලිය,
(ආ) උපදේශකයින්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව,
(ඇ) කළමනාකරණ ගාස්තු, රාජ්‍ය භාග ගෙවීම්, අලෙවිකරන ගාස්තු යන ගෙවීම් පහත සඳහන් ආයතන ඇතුළුව ඇමෙරිකාවේ හයැට් කෝපරේෂන් සමාගමට අයත් හෝ ඊට අනුබද්ධිත ආයතනයකට ගෙවා ඇත්නම්,

* හයැට් ඉන්ටනැෂනල් සවුත් වෙස්ට් ඒෂියා ලිමිටඩ්
* හයැට් ඉන්ටනැෂනල් කෝපරේෂන්
* හයැට් චෙයින් සර්විස(ර්)ස් ලිමිටඩ්
* ඉන්ටනැෂනල් රිසවේෂන් ලිමිටඩ්
* එම්.ජී.පී. ට්‍රැවල් ලිමිටඩ්

ඉහත නිදහස් කිරීම් අදාල වන්නේ කළමනාකරන සහ රාජ්‍ය භාග ගාස්තු දළ මෙහෙයුම් ආදායම් වලින් සියයට තුනක් (3%) නොඉක්මවන්නේ නම් ද, අලෙවිකරණ ගාස්තු දළ මෙහෙයුම් ආදායමින් සියයට එකයි දශම පහක් (1.5%) නොඉක්මවන්නේ නම් ද කළමනාකාර දිරි දීමනා ගාස්තු වශයෙන් සිදු කරන ලද ගෙවීම් දළ මෙහෙයුම් ලාභ වලින් සියයට දහයක (10%) ප්‍රමාණයක් නොඉක්ම වන්නේ නම් ද පමණි.

(ආ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතියට අදාල භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාල දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සහ සේවාවන් සඳහා එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු සහනය ව්‍යාපෘතියට/ව්‍යාපෘති සමාගම වෙත සෘජුවම කරන සැපයුම් පමණක් නොව ව්‍යාපෘති සමාගම අනුමතකරන කොන්ත්‍රාත්කරුවකු වෙත උප කොන්ත්‍රාත්කරුවකු විසින් කරනු ලබන සැපයුම් සඳහාද එකතු කළ අගය මත බදු පනතේ විස්තර කර අවසර දී ඇති ආකාරයට අදාලවේ.

ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් පසු එකතු කළ අගය මත බදු ගෙවිය යුත්තේ 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි සැපයුම් වටිනාකම අනුවයි.

(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් මගින් කරනු ලබන ආනයනයන් සඳහා වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් වලින් නිදහස් වේ.

(ඈ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිතව, ව්‍යාපෘති සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් මගින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතියට අදාල සියලුම ආනයනයන් රේගු බදු අයකිරීම් වලින් නිදහස් වේ.

බැසිල් රෝහණ රාජපක්ෂ,(පා.ම.)
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2012 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

08-832

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.